# 18 කාමමිථ්‍යාචාරය නොකරව



18.1 රූපය - පව්කාර ස්ත්‍රිය සමාව ලබා ගනියි

දේව ස්වරූපයට මැවූ මනුෂ්‍යයා පාරිශුද්ධ ය. ජීවිතයේ උල්පත හෙවත් ආරම්භය රඳා පවතින්නේ ස්ත්‍රී-පුරුෂ සම්බන්ධතා මත ය. එය ද ශුද්ධ වූ තත්ත්වයක් බව ක්‍රිස්තුන් වහන්සේ පෙන්වා දුන් සේක. එම නිසා කිතු සමිඳුන් ප්‍රථම ප්‍රාතිහාර්යය සිදු කළේ කානා නුවර විවාහ මංගල්‍යයේ දී ය. විවාහ වන අය දෙමාපියන්ගෙන් පවා සමුගෙන එකිනෙකා කෙරෙහි බැඳී එක් මාංශයක් වෙති.

විවාහය දේව ප්‍රසාද නිධානයකි. එයින් උත්තරීතර අරමුණක් සඳහා ස්ත්‍රී-පුරුෂ දෙදෙනා එකිනෙකා කෙරෙහි ප්‍රේමයෙන් කැප වෙන බව කිතු දහමේ ඉගැන්වීමයි. විවාහය කෙළිසෙල්ලමක් නොවේ. එය කාම ආශාවන් මුදුන් පමුණුවා ගැනීමේ චේතනාවෙන් සිදු කරන දෙයක් ලෙස සැලකුවොත් එවිට එය දූෂිත ය. ස්ත්‍රී පුරුෂ සබඳතා විවාහයෙන් බැහැර ව සිදු කරන පුද්ගලයෝ විවාහයේ පාරිශුද්ධභාවය කෙලෙසති.

විවාහය ප්‍රේමයේ උත්තරීතර ඵලයයි. නූතන සමාජයෙහි එය කෙලෙසමින් පැවතෙන නමුත් කිතුනුවා එහි උත්තරීතර බව ආරක්ෂා කිරීමට කැප විය යුතු ය. එම නිසා විවාහයට පෙර හෝ පසු කිසි ම අනිසි සම්බන්ධතාවක් ඇති කර නොගත යුතු ය.

අපගේ වචනයෙන් ද ක්‍රියාවෙන් ද බැල්මෙන් ද අප පිරිසිදු විය යුතු වේ. නරක පත පොත කියවීම, කාමුක චිත්‍ර හා චිත්‍රපට බැලීම එයට බාධා ඇති කරන හෙයින් එවායින් වැළකී සිටිය යුතු ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

> කාමමිථ්‍යාචාරය නොකරන්නැයි කී බව ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි; යමෙකු ස්ත්‍රියක දෙස කාමරාගයෙන් බැලූ කෙණෙහි ම ඔහු ඇය සමග සිතින් කාමමිථ්‍යාචාරය කර ඇත.
>
> (මතෙව් 5:28)

### 6වන පනතට විරුද්ධ පාප

- ★ අසභ්‍ය පොතපත කියවීම
- ★ අසභ්‍ය චිත්‍ර හා චිත්‍රපට නැරඹීම
- ★ බහු භාර්යා හා බහු පුරුෂ සබඳතා
- ★ ස්ත්‍රී දූෂණ
- ★ සම ලිංගික සබඳතා
- ★ බාල අපයෝජන
- ★ පූර්ව ලිංගික සබඳතා

### පාරිශුද්ධ ජීවිතයක් ගත කිරීමට

- ★ ආත්ම දමනය
- ★ පරාර්ථකාමි මිත්‍රත්වය
- ★ යාච්ඤාව
- ★ ශරීරයට ගරු කිරීම
- ★ ලිංගිකත්වයට ගරු කිරීම
- ★ සක්‍රමේන්තු තුළින් ලබන දේව වරප්‍රසාද අවශ්‍ය වේ

ශරීරය තිබෙන්නේ අනාචාරය පිණිස නොව, ස්වාමින් වහන්සේ උදෙසා බව 1 කොරින්ති ලිපියේ සඳහන් වේ.

> ශරීරය අනාචාරය පිණිස නොවේ. එය සමිඳාණන් වහන්සේ උදෙසා ය.
>
> (1 කොරින්ති 6:13)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**ක්‍රියාකාරකම**

1. "පිවිතුරු දිවියක් ගත කරමින් ජීවිතයේ පරිශුද්ධතාව සුරකිමු" යන මාතෘකාව යටතේ සඟරාවකට ලිපියක් සකස් කරන්න.
2. හයවන පනතට විරුද්ධ පාප තුනක් ලියා ඉන් වැළකී සිටීමට ඔබ තම මිතුරන්ට දෙන අවවාද **තුනක්** ලියන්න.

**ජීවිතයට බිඳක්**

***සියලු දෙනාට ම සහෝදර ප්‍රේමයෙන් සලකමු; සියල්ලන්ට ගරු කරමු.***



නොමිලේ බෙදාහැරීම සඳහා ය.